පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 08 |

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- **බුද්ධධර්මය**

පාසලේ නම : ..............................................................................

ඇතුළත්වීමේ අංකය : ....................

කාලය : පැය 02

**I පත්‍රය**

- **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**
- **1 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි වරණය තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සිහි කරමින් ආගමික උත්සව පවත්වන්නේ ,

(1) පොසොන් පොහොය දිනයේ දී ය. (2) වෙසක් පොහොය දිනයේ දී ය.

(3) ඇසල පොහොය දිනයේ දී ය. (4) බක් පුර පසළොස්වක පොහොය දිනයේ දී ය.

02. "කුණු සරුප නොකියනු - කේලාම් වචන නොකියනු

විහිළු බොරු නොකියනු - ඇනුම් පද කිසිවෙකුට නොකියනු " යන කවිය සඳහන් උපදේශ ග්‍රන්ථය වන්නේ ,

(1) ලෝවැඩ සඟරාව යි. (2) බුදුගුණ අලංකාරය යි.

(3) සිරිත් මල්දම යි. (4) ලෝකෝපකාරය යි.

03. ත්‍රිවිධ රත්නයේ ගුණ 24කි. ඉන් ධර්ම රත්නයට අයත් ගුණ ගණන වනුයේ ,

(1) 6කි. (2) 9කි. (3) 14කි. (4) 17කි.

04. අපි බොදු සිරිත් අනුගමනය කළ යුත්තේ ,

(1) උපන් දින උත්සවයක දී ය .(2) ගෘහ ප්‍රවේශ මංගල්‍යක දී ය.

(3) අවමංගල්‍ය උත්සවයක දී ය. (4) ඉහත සෑම අවස්ථාවක දී ය.

05. භාවනා කිරීමේ දී අර්ධ පර්යංකයෙන් හිඳ භාවනා කරනු ලබන්නේ ,

(1) පිරිමින් ය. (2) කාන්තාවන් ය. (3) භික්ෂූන් වහන්සේ ය. (4) උපාසක උපාසිකාවන්ය.

06. කෝලිත හා උපතිස්ස දෙදෙනා පැවිදි වූයේ ,

(1) නිගණ්ඨනාථ පුත්ත ළඟ ය. (2) අසිත තාපසතුමා ළඟ ය.

(3) සංජය පිරිවැජියා ළඟ ය. (4) කොණ්ඩඤ්ඤ තාපසතුමා ළඟ ය.

07. බෞද්ධයාගේ හස්ථසාර ග්‍රන්ථය ලෙස හැඳින්වෙන ධම්මපදයේ ගාථා ප්‍රමාණය ,

(1) 26කි. (2) 43කි. (3) 423කි. (4) 450කි.

08. කාව්‍යශේඛරය නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ ,

(1) වීදාගම මහා මෛත්‍රීය හිමි ය. (2) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය.

(3) වෑත්තෑවේ හිමි ය. (4) වල්පොල රාහුල හිමි ය.

09 බෞද්ධයාගේ නිත්‍ය ශීලය ලෙස හැඳින්වෙන්නේ ,

(1) දස ශීලය ය. (2) අට සිල්ය. (3) අෂ්ටාංග ශීලය ය. (4) පන්සිල් ය.

10. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන උතුරු දිශාවට අයත් සමාජ කණ්ඩායම ලෙස දක්වා ඇත්තේ ,

(1) ගුරුවරුන් ය. (2) හිත මිතුරන් ය. (3) දෙමාපියන් ය. (4) පැවිදි උතුමන් ය.

- **11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

11. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ රචනා කරන ලද්දේ .................................................. යුගයේ දී ය.

12. ජෛන ආගමිකයකු වූ .................................................. බුදුරජාණන් වහන්සේ සමීපයට පැමිණ වාද කොට පරාජයට පත්වී බුදු දහම වැළඳ ගන්නා ලදී.

13. .................................................. දම්සක් පැවතුම් සූත්‍රයේ සඳහන් වේ.

14. පස්කම් සැපයෙහි ඇලීම .................................................. නම් වේ.

15. සිතා මතා කරන ක්‍රියාව බුදු දහමේ .................................................. ලෙස හැඳින්වේ.

( උපාලි ගෘහපතියා / කුරුණෑගල / චතුරාර්ය සත්‍ය / කර්මය / කාම තණ්හා )

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි වාක්‍ය සඳහා හරි (√) ලකුණ ද වැරදි වාක්‍ය සඳහා (X) ලකුණ ද හිස්තැනට යොදන්න.**

16. ලෝවැඩ සඟරාව රචනා කරන ලද්දේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ය. ( )

17. කොසොල් රජතුමාගේ බිසව මල්ලිකා දේවිය යි. ( )

18. බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පාන ලද්දේ ලුම්බිණි සල් උයනේ දී ය. ( )

19. පළමු ධර්ම සංගායනාව පැවැත්වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර තුනකට පසුව ය. ( )

20. කිත්සිරිමෙවන් රජුගේ කාලයේ මෙරට දළදා වහන්සේ වැඩමවන ලද්දේ ය. ( )

( ලකුණු 2 × 20 = 40 )

**

## II පත්‍රය

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරක් තෝරා පිළිතුරු ලියන්න.

01.

i. අනණ සූත්‍රයේ සඳහන් ගිහි සැප හතරකි. එයින් දෙකක් ලියන්න.
ii. වජ්ජීන් අනුගමනය කළ රාජ ධර්ම හැඳින්වෙන්නේ කුමන නමකින් ද ?
iii. මංගල සූත්‍රය දේශනා කළේ කවුරුන් හට ද ?
iv. බුදු සසුනේ සඳහන් සිව්වනක් පිරිසෙන් දෙපිරිසක් නම් කරන්න.
v. අනේපිඬු සිටුතුමා හඳුන්වන තවත් නමක් ලියන්න.
vi. දහම් ගුණ අතරින් දෙකක් ලියන්න.
vii. දානමය කටයුත්තක දී සිදු කරන චාරිත්‍ර දෙකක් ලියන්න.
viii. ඍද්ධිමතුන් අතර අග්‍රස්ථානය ලැබුවේ කුමන මහරහතන් වහන්සේ ද ?
ix. බුදු ගුණ භාවනාවේ ආනිසංශ අතරින් දෙකක් ලියන්න.
x. දේවදත්ත හිමියන් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලන ලද පංච වරයන්ගෙන් දෙකක් ලියන්න.

( ලකුණු 2 × 10 = 20 )

02.

i. චණ්ඩාශෝක රජතුමා ධර්මාශෝක රජු බවට පරිවර්තනය වූයේ කුමන සාමණේර වහන්සේ දැකීමෙන්ද ?
ii. මිහිඳු හිමියන් ලංකාවට වැඩමවීම හේතුවෙන් අප ලද උසස් මානව ගුණාංග අතරින් තුනක් ලියන්න.
iii. එම ගුණාංග අපගේ ජීවිතයට කෙසේ වැදගත් වන්නේ දැයි පැහැදිලි කරන්න.

03.

i. බුදු දහමේ සඳහන් ධාර්මික ධනෝපායන මාර්ග අතරින් දෙකක් ලියන්න.
ii. බුදු දහමේ ප්‍රතික්ෂේප කරන ලද වැරදි වෙළඳාම් ක්‍රම තුන ලියන්න.
iii. සම්පත් සීමිත බැවින් සම්පත් පරිහරණයේ දී අප සැලකිලිමත් විය යුතු කරුණු මොනවා දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

04.

i. ශාසන ඉතිහාසයේ පළමු ධර්ම සංගායනාව පැවැත්වූයේ කුමන ස්ථානයේ දී ද ?
ii. එම ධර්ම සංගායනාව පැවැත්වීමට ආසන්නම හේතුව කුමක් ද ?
iii. පළමු ධර්ම සංගීතිය පැවැත්වීමෙන් ලැබුණු ප්‍රතිඵල පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

05.

i. මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයෙකු වී උපන්නේ කවර කුසල කර්මයක් කිරීමෙන් ද ?
ii. වචනයෙන් සිදුවන අකුසල්වලින් තුනක් ලියන්න.
iii. කුසල් අකුසල් පිළිබඳව අවබෝධයෙන් යුතුව සිටින ඔබ විසින් සිදු කරනු ලබන හොඳ ක්‍රියා පහක් ලියන්න.

06.

i. දළදා වහන්සේ ලක්දිවට වැඩම කරන ලද්දේ කවුරුන් විසින් ද ?
ii. සප්ත අපරිහානී ධර්ම අතරින් තුනක් ලියන්න.
iii. තමන් අනෙක් අයගේ සිතුවිලි දැන හැඳින සාමකාමීව ජීවත් වීමට කටයුතු කිරීම තුළින් සමාජයට වන යහපත කෙටියෙන් පැහැදිලි කරන්න.

07.

i. කිසියම් ස්ථානයකට ආගන්තුකව ඇතුල්වීමේ දී අනුගමනය කළ යුතු චාරිත්‍ර මොනවා ද ?
ii. භික්ෂූන් වහන්සේලා උදෙසා චීවර පරිහරණයේ දී සැලකිය යුතු කරුණු අතරින් තුනක් ගෙන හැර දක්වන්න.
iii. අපගේ ඇඳුම් පැළඳුම් පරිහරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

***

8 වසර බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය ( 2022 - අවසාන වාරය )

I පත්‍රය

1) 2
2) 3
3) 1
4) 4
5) 2
6) 3
7) 3
8) 2
9) 4
10) 2
11) කුරුණෑගල
12) උපාලි ගෘහපතියා
13) චතුරාර්ය සත්‍ය
14) කාම තණ්හා
15) කර්මය
16) x
17) √
18) x
19) x
20) √

II පත්‍රය

01)

- i අත්ථි සුඛ , භෝග සුඛ , අනණ සුඛ , අනවජ්ජ සුඛ
- ii සප්ත අපරිහානී ධර්ම
- iii දෙවියන් හට
- iv භික්ෂු , භික්ෂුණී , උපාසක , උපාසිකා
- v සුදත්ත සිටුතුමා
- vi ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ , සන්දිට්ඨිකෝ , අකාලිකෝ , ඒහිපස්සිකෝ... ආදි දහම් ගුණ වලට ලකුණු පිරිනමන්න.
- vii දැහැත් වට්ටියක් දී ආරාධනා කිරීම , පා දෝවනය කිරීම ... ආදී චාරිත්‍ර
- viii මුගලන් මහරහතන් වහන්සේ
- ix බුදුරජාණන් වහන්සේ පිළිබඳ අසීමිත පැහැදීමක් ඇති වීම , පාපයට ලජ්ජාව හා බිය ඇති වීම ... ආදි කරුණු ( පෙළපොතේ 34 පිටුවෙහි සඳහන් පරිදි )
- x භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වා ම ආරණ්‍යක ව විසිය යුතුයි.
  භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වා ම පිණ්ඩපාතයෙන් යැපිය යුතුයි.
  භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වා ම පාංශුකූලික විය යුතුයි.
  භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වා ම වෘක්ෂ මූලිකව විසිය යුතුයි.
  භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වා ම මස් මාංස වැළඳීමෙන් වැළකී විසිය යුතුයි.

02)

- i නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ
- ii පරෝපකාරය , අවිහිංසාව , ආගන්තුක සත්කාරය , සහයෝගයෙන් ජීවත් වීම , අන් අයගේ අදහස් ගරු කිරීම , සරල බව ... ආදී ගුණාංග
- iii එම ගුණාංග ජීවිතයට අදාළ කර , අනුගමනය කිරීමෙන් ඇති වන වටිනාකම , පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

03)

- i 1.කෘෂිකාර්මික කටයුතු
  2.ධාර්මික වෙළඳාම
  3.රාජ්‍ය සේවය
  4.ගව පාලනය
  5.අනෙකුත් ශිල්ප කර්මාන්ත
- ii 1.අවි ආයුධ වෙළඳාම
  2.සත්ත්ව වෙළඳාම
  3.මස් වෙළඳාම
  4.මත් ද්‍රව්‍ය වෙළඳාම
  5.වස විස වෙළඳාම
- iii පවතින ස්වභාවික සම්පත් සීමිත බැවිනුත් , අවශ්‍යතා අසීමිත බැවිනුත් , නිසා අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතු බව , ආරක්ෂා කළ යුතු බව පෙන්වා දී ඇත්නම් ලකුණු ලබා දෙන්න.

04)

- i රජගහ නුවර වේභාර පර්වත ප්‍රාන්තයේ සප්තපර්ණී ගුහා ද්වාරයේ පනවන ලද මණ්ඩපයේ
- ii සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශය ( 121 පිටුව )
- iii ධර්ම විනය එක්රැස් කිරීම , විනය කොටස් 5 කට බෙදීම , භාණක පරපුරක් බිහි කිරීම... ආදී කරුණු

05)

- i බුදුරජාණන් වහන්සේ කෙරෙහි සිත පහදවා ගැනීමෙන්
- ii බොරු කීම , කේලාම් කීම , හිස් වචන කීම , පරුෂ වචන කීම
- iii පොදුවේ අප විසින් කරන හොඳ ක්‍රියා ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න.

06)

- i හේමමාලා කුමරිය සහ දන්ත කුමරු විසින්
- ii නිතර නිතර රැස්වීම , සමගිව රැස්වීම (141 පිටුව)
- iii අනෙක් අයගේ අභිලාෂයන් දැනගැනීම තුළින් එදිනෙදා ඇති වන ගැටලු අවම කර ගත හැක.අන් අයගේ මත වලට ගරු කිරීම ආදිය තුළින් සමාජයේ සමගිය සමාදානය ඇතිවේ. පිළිතුර සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.

07)

- i උගුර පෑදීම , පා හඬ නැඟීම , අවසර ගැනීම … ආදී කරුණු
- ii 54 පිටුවේ සඳහන් කරුණු 8 ක් වේ
- iii තැනට , වයසට ගැළපෙන ශරීරය නිරාවරණය නොවන වාම් පිරිසිදු ඇඳුම් පරිහරණය කිරීම… ආදී කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.